# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/04-06/J-M/Circular/ 2021 | ............................................ | 2021.03.25 |

**සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/02**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් / සංවර්ධන නිලධාරින් වෙත.

**ජීවනෝපාය සංවර්ධන හා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2021**

සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරිමේ වැඩසටහන (සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/05) හා තරුණ කාන්තා ව්‍යවසායකයින් 25,000 ක් ඉලක්ක කරගත් ගෘහස්ථ අලෙවි සැල් ස්ථාපිත කිරිමේ වැඩසටහන (සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/06) සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් මේ වන විටත් ඔබ වෙත ලබා දී ඇත.

ඉහත වැඩසටහන් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ අප දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර **2021 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික අයවැය මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන** යටතේ පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක වන බව කාරුණිකව ඔබ වෙත දන්වා සිටිමි.

**ජීවනෝපාය සංවර්ධන වැඩසටහන- 2021**

***1. විශේෂ ජීවනෝපාය ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන***

ජීවනෝපාය සංවර්ධන අංශය වෙත මෙම වසරේ වෙන්වී ඇති සීමිත ප්‍රතිපාදන යටතේ ඔබ දිස්ත්‍රික්කයේ විශේෂ ජීවනෝපාය ව්‍යාපෘති සීමිත සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රතිපාදන වෙන් කිරිමට තීරණය කර ඇත.

මේ යටතේ සමෘද්ධිලාභින්ගේ ජීවනෝපාය සංවර්ධනයන් වඩාත් වර්ධනය කර ගැනිමට හෝ නව ස්වයං රැකියා අවස්ථා ඇති කිරිම අරමුණ වන බැවින් ඔබ වෙත වෙන් වන සීමිත ප්‍රතිපාදනයන් තුලින් හැකි උපරිම ප්‍රතිලාභින් පිරිසක් ආර්ථික වශයෙන් සවිබලගැන්වෙන ආදායම් උත්පාදන කාර්යයකට යොමු කිරිමට කටයුතු කළ යුතුවේ.

මේ යටතේ ව්‍යාපෘතිලාභින් හඳුනා ගැනිමේදි මා විසින් ඔබ වෙත නිකුත් කර ඇති DSD/HO/04/ER/Emp/2021 හා 2021.01.19 දිනැති "සමෘද්ධි සහනාධාරලාභි පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන - 2021 " ලිපියට අනුව ඉලක්ක ගත ප්‍රතිලාභින් පහත පරිදි විය යුතු වේ.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

I. " සවිබලගැන්විය හැකි " සමෘද්ධිලාභීන්ගේ "මධ්‍යම හා පහල" කාණ්ඩයට අයත් සමෘද්ධි සහනාධාරලාභීන්.

II. " සවිබලගැන්විය හැකි" සමෘද්ධිලාභීන්ගේ "ඉහළ" කාණ්ඩයට අයත්, සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුලත් නොවූ සමෘද්ධි සහනාධාරලාභීන්.

මෙම වැඩසටහන සඳහා එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රු. 3,850,000 /- ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වන අතර එක් ව්‍යාපෘතිලාභියෙක් වෙනුවෙන් වෙන් කල හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රු. 50,000 /- ක් වනු ඇත. එසේ වුවද මෙම උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුකමිටුවේ අනුමැතිය මත රු. 100,000/- දක්වා වැඩි කළ හැකි වේ. එමෙන්ම රු. 100,000/- යේ සීමාව ඉක්මවන සුවිශේෂී ව්‍යාපෘති ඇත්නම් අදාල ව්‍යාපෘති වාර්තාව ද සමඟ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත අතර දිස්ත්‍රික්කයට වෙන් වන ප්‍රතිපාදන සීමාව තුල මෙය ගලපා ගැනීමට කටයුතු කළ යුතු වේ. අවම වශයෙන් ප්‍රතිලාභීන් 77 දෙනෙකුවත් මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති ගන්වා සවිබලගැන්වීමට කටයුතු කළ යුතු වේ. ඒ අනුව *ආකෘති අංක 01* ට අනුව ව්‍යාපෘතිලාභීන්ගේ තොරතුරු ලබා ගත යුතු අතර අප්‍රේල් මස 20 දිනට පෙර ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මා වෙත එවීමට කටයුතු කිරීම මැනවි. *(CRM මොඩියුලයට ව්‍යාපෘති තොරතුරු ඇතුලත් කළ පසු)*

මේ වන විටත් ඔබ දිස්ත්‍රික්කයේ සහාය සේවා ආයතන හා සම්බන්ධ වෙමින් ව්‍යාපෘති හඳුනා ගනිමින් සිටින බැවින් මෙම වැඩසටහන යටතේ තෝරා ගනු ලබන ව්‍යාපෘති ද ඒ හා සමානව ප්‍රතිලාභී ආදායම වර්ධනය වන හා ප්‍රතිලාභීන් සවිබලගැන්වෙන ව්‍යාපෘති වීම අත්‍යාවශ්‍ය වනු ඇත.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එකී ව්‍යාපෘති සඳහා දරන වියදමට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 0.5% ක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 1.5% ක් ද වන සේ ව්‍යාපෘති සඳහා වෙන් වන මුදලින් පරිපාලන වියදම් ලෙස දැරීමට හැකියාව ඇත.

එමෙන්ම CRM මොඩියුලය හරහා " Project Applicants 2021" Click කර "Special Livelihood Projects" ඔස්සේ මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් කළ යුතු බවද වැඩිදුරටත් පෙන්වා දෙමි.

***2. සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන***

**පුහුණුවීම් හා දැණුවත් කිරීම් සඳහා ප්‍රතිපාදන ලබා දීම**

සමෘද්ධිලාභී පවුල් 200,000 ක් සවිබලගැන්වීම ඉලක්ක කර ගනිමින් සහාය සේවා ආයතන හා ඒකාබද්ධව මේ වන විට ඔබ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙමින් පවතින මෙම වැඩසටහන යටතේ තෝරා ගනු ලබන ව්‍යාපෘතිලාභීන් සඳහා දැණුවත් කිරීම් හා පුහුණුවීම් ලබා දීමට සිදුවනු ඇත.

මේ යටතේ මූල්‍ය සාක්ෂරතාව සියළු ව්‍යාපෘතිලාභීන්ට ලබා දීම අනිවාර්ය වන අතර ඊට අමතරව අත්‍යාවශ්‍ය දැණුවත් කිරීම් හා ව්‍යාපෘතියට අදාලව තාක්ෂණික පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අරමුණ සඳහන් කරමින් විස්තර සහිත ඉල්ලීම් ලිපියක් ඇස්තමේන්තුව සමඟින් මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් දන්වමි.

සම්පත්දායකත්වය අදාල රේඛීය ආයතනයෙන් ලබා ගත යුතු අතර අදාල පුහුණුවීම් හෝ දැණුම්වත් කිරීම් සඳහා තේ පැන් හා ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් පමණක් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරනු ඇත. මීට අමතරව වෙනත් අයිතමයන් වෙනුවෙන් ප්‍රතිපාදන ඇතුලත් කළයුතු වන්නේ නම් ඒ සඳහා අත්‍යාවශ්‍ය බව විශේෂයෙන් තහවුරු කිරීමට කටයුතු කල යුතුවේ.

මේ අතරින් මූල්‍ය සාක්ෂරතාවය ලබා දීමට අදාලව පුහුණු මොඩියුලය හා ඊට අදාල පුහුණුව ලබා ගත හැකි සහාය සේවා ආයතන සම්බන්ධයෙන් විස්තර නොපමාව ඔබ වෙත ලබා දීමට කටයුතු කරන බව පෙන්වා දෙමි.

## ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2021

"සෞභාග්‍යයේ දැක්මට" සමගාමීව "ව්‍යවසාය සංවර්ධන වැඩසටහන" යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය.

1. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන ඉදි කිරීම හා වැඩිදියුණු කිරීම.
2. දුම්රිය ස්ථාන ආශ්‍රිතව සමෘද්ධි නිෂ්පාදන අලෙවිසැල් ඉදි කිරීම.
3. සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන හා සේවා අන්තර්ජාල වෙළඳපොලට ප්‍රවේශ කරවීම (Online Marketing).
4. "සමෘද්ධි අභිමානී 2021" අලෙවි පොලවල් පැවැත්වීම.
5. මුහුණු පොතේ ව්‍යාපාරික ජාලය(Samurdhi Business Directory on Facebook ).
6. සමෘද්ධි ව්‍යාපාරික සංගම් ප්‍රතිව්‍යුහගත කිරීම.
7. ව්‍යාපාරික කාන්තාවන් සඳහා වසවිස රහිත ආහාර සැකසීම පිළිබඳ පුහුණුව
8. රූපලාවන්‍ය හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය
9. විශේෂ අලෙවි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 1. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන ඉදිකිරීමේ හා වැඩිදියුණු කිරීමේ වැඩසටහන

සාර්ථකව පවත්වාගෙන යනු ලබන සමෘද්ධි සුව බොජුන්හල් වැඩසටහන මෙම වසරේදී ද පහත සඳහන් වැඩසටහන් 03 ඔස්සේ ක්‍රියාත්මක වනු ඇත.

I. **නව සමෘද්ධි සුව බොජුන්හල්** 15 ක් ආරම්භ කිරීමට අපේක්ෂිත අතර දැනටමත් සමෘද්ධි සුව බොජුන්හල් ආරම්භ කර සාර්ථකව පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික්ක සඳහා මෙන්ම තවදුරටත් ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යනු ලබන දිස්ත්‍රික්ක සඳහා ද මේ යටතේ යෝජනා ඉදිරිපත් කළ හැක. මෙම වැඩසටහනට සඳහා අංක DSD/HO/6/EP/2/SS/10 හා 2019.05.31 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් තවදුරටත් වලංගු වන අතර එහි සඳහන් පොදු සැලැස්මට අනුව විදුලිය, ජල සැපයුම හා වැසිකිළි පහසුකම් සහිතව ඇස්තමේන්තුව හා ව්‍යාපෘති යෝජනාව මා වෙත යොමු කළ යුතු වේ.

II. මීට අමතරව දැනටමත් සාර්ථකව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන **සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථානයන් වැඩිදියුණු කිරීම** සඳහා එනම් විදුලිය, ජලය, සනීපාරක්ෂක පහසුකම්, ආරක්ෂිත වැට ආදී අත්‍යාවශ්‍ය කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දෙනු ඇත.

III. පසුගිය වර්ෂවලදී ඉදිකිරීම් ආරම්භ කර ඇස්තමේන්තු ප්‍රකාරව තවදුරටත් **වැඩ අවසන් කර නොමැති මධ්‍යස්ථාන (අවිච්ඡේද)** සඳහා ද ප්‍රතිපාදන ඉල්ලුම් කළ හැක.

ඉහත සඳහන් අයිතමයන් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී එම වැඩසටහනට අදාලව ( ඉහත I, II, III යටතේ) ප්‍රතිපාදන ඉල්ලුම් කළයුතු වේ.

### 2. දුම්රිය ස්ථාන ආශ්‍රිතව සමෘද්ධි නිෂ්පාදන අලෙවිසැල් ඉදි කිරීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව දැනටමත් එකඟතාවය පළ කර ඇති පරිදි මුල් අදියර යටතේ මෙම වසරේදී දුම්රිය ස්ථාන 25 ක් තුළ අලෙවිසැල් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර කොළඹ කොටුව සහ මරදාන යන දුම්රිය ස්ථානයන්හි හැර දිවයිනේ ඕනෑම දුම්රිය ස්ථානයක් මේ සඳහා ඔබට තෝරා ගත හැකිය. ඔබ දිස්ත්‍රික්කයේ ඇති දුම්රිය ස්ථාන තුළ අලෙවිසැලක් ආරම්භ කිරීමට ඇති ශක්‍යතාවය පිළිබඳව ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කළ යුතු අතර ව්‍යවසාය සංවර්ධන අංශය මගින් අලෙවිසැලේ පොදු ආකෘතියක් සහ එයට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ඇත. එසේම, මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යාම පිළිබඳව මෙහෙයුම් උපදෙස් ඉදිරියේදී ඔබ වෙත යොමු කරනු ඇත.

### 3. සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන හා සේවා අන්තර්ජාල වෙළඳපොලට ප්‍රවේශ කරවීම (Online Marketing)

මේ යටතේ දැනටමත් "ඩරාස් (Daraz.lk)" හා "ඕනවැඩක් (Onwedak.lk)" යන පෞද්ගලික ආයතන සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර තවත් එවැනි ආයතන සමග සම්බන්ධ වී මෙම වැඩසටහන තව දුරටත් පුළුල් කිරීමට අදහස් කර ඇත. ඒ අනුව පසුගිය වසරේදී මෙම

වැඩසටහන පිළිබඳව දැණුවත් කිරීමට නොහැකි වූ දිස්ත්‍රික්ක වල ව්‍යවසායකයින් මෙන්ම ප්‍රවේශ වීමට කැමැත්ත ඇති අනෙක් දිස්ත්‍රික්ක වල ව්‍යවසායකයින් ද දැනුවත් කිරීම සඳහා අන්තර්ජාල වෙළඳ නියෝජිතයින් හා සම්බන්ධීකරණය කිරීම ව්‍යවසාය සංවර්ධන අංශය මගින් සිදු කරනු ඇත.

4. **"සමෘද්ධි අභිමානී 2021" අලෙවි පොලවල් පැවැත්වීම**

සමෘද්ධි වැඩසටහන තුලින් ගොඩනැගුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපළ පුළුල් කර දීමට, බැංකු / කලාප මට්ටමින් සමෘද්ධි අභිමානී අලෙවි පොල පැවැත්වීම මෙම වැඩසටහනේ අරමුණ වේ. ඒ අනුව එළඹෙන සිංහල හා හින්දු අළුත් අවුරුද්ද මුල් කරගෙන " සමෘද්ධි අභිමානී 2021" අලෙවි පොල සංවිධානය කළ යුතුය.

5. **මුහුණු පොතේ ව්‍යාපාරික ජාලය / Samurdhi Business Directory on Facebook**

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම සමාජ ජාලා අඩවිය වන මුහුණු පොත තුළ සමෘද්ධි ව්‍යවසායක සමූහයක් (Facebook Business Group) ගොඩනගමින් ඔවුන්ගේ නිෂ්පාදින සඳහා නව වෙළඳපොලක් නිර්මාණය කිරීම මෙහි අරමුණ වේ. දැනටමත් ලොකයේ බොහෝ රටවල් තුල නිෂ්පාදකයින් හා සේවා සපයන්නන් විසින් තම නිෂ්පාදිත සඳහා භාවිතා කරනු ලබන පහසු හා ජනප්‍රිය වෙළඳපොලක් ලෙස මෙය හැඳින්විය හැක. උක්ත වැඩසටහන පසුගිය වසරේ ආරම්භ කරන ලද නමුත් දිවයින තුල ඇතිවූ කොවිඩ් වසංගත තත්ත්වය නිසාවෙන් මෙන්ම, මෙම නව වෙළඳපොල පිළිබඳව ව්‍යවසායකයින් තුල ඇති දැණුවත් භාවය ප්‍රමාණවත් නොවන නිසාවෙන් මෙම ජාලය තුලට ව්‍යාපාරිකයින් ඇතුලත් කර ගැනිම, ක්‍රමවත්ව සිදු නොවූ අතර 2021 වසරේදී මේ පිළිබඳව නව මුහුණුවරකින් ඉදිරියේදි ව්‍යවසාය සංවර්ධන අංශය විසින් දැනුවත් කරනු ඇත.

6. **සමෘද්ධි ව්‍යාපාරික සංගම් ප්‍රතිව්‍යුහගත කිරීම**

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම එක් සංගමයක් වන සේ ප්‍රාදේශීය සමෘද්ධි ව්‍යාපාරික සංගම් ස්ථාපිත කරන ලෙස 2015 වසරේදි උපදෙස් ලබාදී ඇති අතර මේ වන විට ඉන් බොහොමයක් විවිධ වූ හේතුන් මත අක්‍රිය තත්ත්වයට පත්ව ඇති බව ලැබෙන තොරතුරු අනුව පෙනී යයි. සමෘද්ධි වැඩසටහනින් පෝෂණය වන ව්‍යවසායකයින් සාමාජීය වශයෙන් කණ්ඩායමක් ලෙස සවිබල ගැන්වීම අපේක්ෂිත වන බැවින් ඔවුන් හුදකලා වීම තුළ මූලික අභිප්‍රායන් වැඩසටහනින් දුරස්වනු ඇත.

එබැවින් ඔවුන් ඒකරාශී කිරීමට මෙතෙක් පැවති දුර්වලතා මගහරිමින් පහත පරිදි සංවිධාන කටයුතු සිදුකළ යුතු අතර නව සංගම් ස්ථාපිත කිරීමේදි මීට පෙර ප්‍රාදේශීය ව්‍යවසායක සංගම් ක්‍රියාත්මක කිරීමට යාමේදි ඇතිවූ බාධක පිළිබඳව සැලකිලිමත් විය යුතු සේම සෑම විටම ව්‍යවසායක ප්‍රජාවගෙන් ඒ පිළිබඳව තොරතුරු ලබාගත යුතුය.

I. දැනට ශක්තිමත් හා ක්‍රියාකාරී තත්ත්වයේ ඇති සමෘද්ධි ව්‍යවසායක සංගම් ඒ ආකාරයෙන්ම ඉදිරියටත් පවත්වාගෙන යා හැකි අතර ඊට අමතරව පැහැදිලි අවශ්‍යතාවයක් හෝ ව්‍යාපාරික පිරිසකගේ ඉල්ලීම් ඇත්නම් ස්වාධීන වූ වෙනත් සමජාතිය හෝ විෂම ජාතීය සංගම් එකක් හෝ කීපයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාපිත කිරීම.

II. ප්‍රාදේශීය ව්‍යාපාරික සංගමය අක්‍රිය තත්ත්වයේ පවතී නම්, සමජාතීය ව්‍යාපාර කටයුතු සිදු කරන ව්‍යවසායකයින්ගේ හෝ පහසුවෙන් රැස්විය හැකි මෙන්ම භූගෝලිය වශයෙන් ආසන්නව ව්‍යාපාර කටයුතු සිදුකරන ව්‍යාවසායකයින්ගේ හෝ එකතුවෙන් සංගම් කීපයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාපිත කිරීම.

ඒ අනුව අළුතින් ආරම්භ කරන සෑම සංගමයක මහා සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් සහභාගිවන එක් අයෙකුට රු.100.00 ක් වන සේ උපරිම රු.4,000.00 ක ප්‍රතිපාදන ලබාදෙනු ඇත.

## 7. ව්‍යාපාරික කාන්තාවන් සඳහා වසවිස රහිත ආහාර සැකසීම පිළිබඳ පුහුණුව

වස විස රහිත ආහාර පාන සැපයීම තුලින් සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ කාන්තාවන් තිරසාර ලෙස සවිබල ගැන්වීම අරමුණු කරගනිමින් සමෘද්ධි සුව බොජුන්හල් වැඩසටහන හා සම්බන්ධ ව්‍යවසායක කාන්තාවන් සඳහා ආහාරපාන නිෂ්පාදනය, සැකසීම හා අලෙවි කිරීම පිළිබඳව විධිමත් පුහුණුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු අංශයේ තාක්ෂණික සහාය මත ලබා දෙනු ඇත.

## 8. රූපලාවන්‍ය හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය

i. සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ කාන්තාවන් සවිබල ගැන්වීම තව දුරටත් ව්‍යාප්ත කරමින් දැනටමත් රූපලාවන්‍ය කර්මාන්තයේ යෙදෙන හෝ යෙදීමට බලාපොරොත්තු වන කාන්තාවන් සඳහා පුහුණුවක් ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් මගින් ලබාදෙනු ඇත. මෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ දේශීය ශාකසාර ඖෂධ භාවිතයෙන් සිදුකරන රූපලාවන්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම වන අතර මේ පිළිබඳ වැඩිදුර උපදෙස් ඉදිරියේදී ලබාදෙනු ඇත.

ii. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ගෘහ ආශ්‍රිත කර්මාන්ත වල යෙදෙන සමෘද්ධි කාන්තා ව්‍යවසායිකාවන් සඳහා තම නිෂ්පාදනවල තත්ත්වය, ගුණාත්මක භාවය, ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සහ අගය එකතු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර හා උපකරණ සැපයීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලබාදීමට මේ යටතේ හැකියාව ඇත. එක් ව්‍යවසායකයක කාන්තාවක් සඳහා එක් අවශ්‍යතාවක් වෙනුවෙන් පමණක් නැවත අය නොකිරීමේ පදනම මත ප්‍රතිපාදන ලබාදිය හැකි අතර ඇයගේ දායකත්වය සමස්ථ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුවෙන් 40% ක් වත් විය යුතුය.

ලබා දෙන උපරිම මුදල රු. 5000.00 ක් වන අතර යම් ප්‍රතිලාභියෙකු සඳහා රු. 5,000/- ක දෙපාර්තමේන්තු දායකත්වය ප්‍රමාණවත් නොවන්නේ නම් එය රු. 10,000 /- ක් දක්වා වැඩි කළ හැකි වුවත් ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතියක් ලබාගත යුතුය. ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා මෙම වැඩසටහන යටතේ වෙන් කරන ලද මුදල ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

## 9. විශේෂ අලෙවි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ව්‍යවසාය සංවර්ධන වැඩසටහනේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් නොවූ එහෙත් අත්‍යවශ්‍යව ඉටු කළ යුතු හෝ කාලීන අවශ්‍යතාවයක් මත කළ යුතු වැඩසටහන් හෝ යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම මේ යටතේ සිදු කරනු ලැබේ. මේ සඳහා ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය දී කටයුතු කෙරෙනු ඇත.

### පොදු උපදෙස් ( ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සඳහා)

1. ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රජාවට ගැලපෙන ආකාරයට මෙන්ම ව්‍යාපාරයේ තිරසාර බව තහවුරු වන ආකාරයට ප්‍රතිලාභීන් තෝරා ගැනීම කළ යුතු අතර ඔහු /ඇය ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකයෙකු බවට තහවුරුවක් ලබාගත යුතුය.

2. ව්‍යාපෘති සඳහා වන සියළු මිලදී ගැනීම් හා අනෙකුත් සියළු කටයුතු රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලීන්ට අනුකූලව සිදු කළ යුතු බව අවධාරණය කෙරෙන අතර අදාල ආයතන හා දෙපාර්තමේන්තු නිර්දේශිත මිල ගණන් සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීමටද වගබලා ගත යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් වලට එළඹීමෙන් පසුව මුදල් නිදහස් කිරීමට පියවර ගැනීම වඩාත් සුදුසු වේ.

3. ඉදිකිරීම් වලට අදාලව ආරම්භ කරනු ලබන ව්‍යාපෘති සියල්ල මෙම මුදල් වර්ෂය තුළ ඉදිකිරීම් අවසන් කළ යුතු අතර කිසිදු විටෙක ව්‍යාපෘති අවිච්ඡේද නොකළ යුතුය.

4. ව්‍යාපෘති අධීක්ෂණය, පසු විපරම් ක්‍රියාවලිය මෙන්ම ප්‍රගති සමාලෝචනයද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුවිය යුතු අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසා ගත යුතුය.

5. භාණ්ඩාගාර ඍජු ප්‍රතිපාදන යටතේ කේවල ව්‍යාපෘති සඳහා අනුමත කරන මුදල් නැවත අය කිරීමක් නොකෙරේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එකී ව්‍යාපෘති සඳහා සත්‍ය වශයෙන්ම දරන වියදමට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 0.5% ක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 1.5%ක් ද වන සේ පරිපාලන වියදම් වෙන් කරනු ලැබේ.

6. ප්‍රාදේශීය මට්ටමෙන් හඳුනාගන්නා ලද තනි පුද්ගල ව්‍යාපෘති යෝජනා ඇමුණුම් අංක 03 ආකෘතියට අනුව ද, අනෙකුත් ව්‍යාපෘති වෙනම යෝජනා ලෙස ද වන පරිදි ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයෙන් දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතුය.

7. දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ව්‍යාපෘති ලේඛනය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ඇමුණුම 04 මඟින් ව්‍යවසාය සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කොට ලබා ගත යුතුය.

8. සෑම මසකම අවසන් දිනට සකස් කරන ලද මාසික ප්‍රගති වාර්තාව ඇමුණුම් අංක 05 මඟින් එළඹෙන මස 10 වන දිනට පෙර අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.

9. ව්‍යාපෘතිවලට අදාල ප්‍රදර්ශන නාම පුවරු සමෘද්ධි ලාංඡනය සහිතව අනුමත වර්ණයන් යොදා සකස් කළ යුතුය.

එසේම මේ වන විටත් මා විසින් ඔබ වෙත එවන ලද "සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට අදාල (සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/05) " චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි. එහි සඳහන් පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීමේදී **සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන** ක්‍රියාත්මක කිරීමේදී ගරු රාජ්‍ය ඇමතිතුමා සහ අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2021.03.23 දින සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් සහ දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂවරුන් සමඟ පැවති රැස්වීමේදී එළඹි තීරණ වලට අනුව වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි.

ජීවනෝපාය සංවර්ධන හා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා ඔබ දක්වන සහයෝගය අගය කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වුවහොත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා 011-2873801 දුරකතන අංකයටද ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සඳහා 011-2887013 දුරකතන අංකයටද අමතන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.පි |
| 02. | අතිරේක ලේකම් (සංවර්ධන II), සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.පි |
| 03. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් | - | අ.ක.ස |
| 04. | ප්‍රධාන ගණකාධිකාරී | - | අ.ක.ස. |
| 05. | ප්‍රධාන අභ්‍යන්තර විගනක | - | අ.ක.ස. |
| 06. | සියළුම අංශ ප්‍රධානීන් | - | අ.ක.ස. |